*සිංහල භාෂාව හා සාහිත්‍ය* **10 ශ්‍රේණිය**

## <u>සිසු පැවරුම</u>

---

පත්‍රය - 01

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත** කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. අද ජනතාව **ගොනාට ඇන්දවීම** අසීරු කරුණක් බව කථිකයා පැවසුවේ ය.
   (1) විහිළුවට භාජනය කිරීම. (2) විවේචනය කිරීම.
   (3) නොසලකා හැරීම. (4) මුළා කිරීම.

2. ආගම **දඬම්මා** කරගත් සංවිධාන අද රට පුරා දක්නට ලැබේ.
   (1) ආධාර කරගත් (2) අයුතු සේ යොදාගත්
   (3) මුල් කරගත් (4) එල්ල කරගත්

3. ගමේ ඕනෑම කටයුත්තකට **අකුල් හෙළීම** ඔහුගේ පුරුද්දකි.
   (1) නොසලකා සිටීම. (2) කැමැත්ත නොදීම.
   (3) ආධාර නොදීම. (4) බාධා පැමිණ වීම.

- අංක 04 - 05 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. කථා කිරීමේ දී මුවින් නිකුත් වන ශබ්ද ලියා දක්වන ........................................ සංකේත අක්ෂර හෙවත් අකුරු නමින් හැඳින්වේ.
   (1) ශ්‍රැතිගෝචර (2) දෘෂ්ටිගෝචර (3) බුද්ධිගෝචර (4) භාවගෝචර

5. සාර්ථක කෙටි කතාවක් නිර්මාණය කිරීමට නිරන්තර පුහුණු වීම හෙවත් ........................................ අවශ්‍ය වේ.
   (1) පලපුරුද්ද (2) අභ්‍යාස (3) ප්‍රතිභාව (4) සතතාභ්‍යාසය

6. අකාරාදී පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) ආස්වාදය, ආරම්භය, කැමැත්ත, කරුණාව (2) උපකාරය, උනන්දුව, ගැලවීම, ගාස්තුව
   (3) ඒකාකාර, එතෙර, මේබලාව, මිහිකත (4) ඉතිරිය, ඉමහත්, සරතැස, සිහිනය

7. අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.
   (1) මිශ්‍රණය, ධාරානිපාත, විමර්ශනය, මූර්ධජ (2) වර්තමාන, පුස්ථකාලය, සංස්කෘතිය, ප්‍රතිඵල
   (3) අනවශ්‍ය, සැළකිල්ල, යතාර්ථය, සාධාරණ (4) අක්ගර, විෂය, භූමිය, ප්‍රශ්ණ

පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුතු ය. මෙම වාක්‍යයේ යන්නන් යනු,
   (1) උක්ත පදයකි. (2) නිපාතයකි.
   (3) කෘදන්තයකි. (4) අසම්භාව්‍ය ක්‍රියාවකි.

රජකුමරිය රජතමය මාලයක් පැළඳ සිටියා ය. මෙහි රජතමය යනු,
   (1) කර්ම විශේෂණයකි. (2) නාම විශේෂණයකි.
   (3) ක්‍රියා නාමයකි. (4) තද්ධිත පදයකි.

10. නාම ප්‍රකෘති පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) කුරුලු, පැන්, කැලෑ, වලස් (2) හාවා, පිලා, දූවි, කුමර

(3) මිනිස්, ගොන්නු, මැසි, බලු (4) ගොවීන්, පොත්, මහලු, කතුර

11. **අනුක්ත නාම පද** පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) මා, දරුවන්, තෝ, මවක් (2) මිතුරියක, අප, සමහරුන්, ඔවුන්

(3) අපි, ළමයි, ඇය, කතුන් (4) ගායකයන්, නිළියක්, හොරු, ඕනු

12. පහත සඳහන් පදවලින් ක්‍රියා විශේෂණයක් නොවන්නේ,

(1) කැමැත්තෙන් (2) විමසමින් (3) කෝපයෙන් (4) හෙමින්

13. "කිසිවෙකුටත් දෙවැනි නොවන" යන යෙදුම සඳහා වඩාත් සුදුසු තනිපදය වන්නේ,

(1) අසමාන (2) පළමුවැනි (3) අද්විතීය (4) අනුපමේය

14. "තද්භව පද" පමණක් ඇති වරණය වන්නේ,

(1) ශිෂ්‍ය, සසුන, නෙත්, දන්ත (2) පිළිම, අක්ෂි, ප්‍රශ්න, සිත

(3) අරුත්, ඡත්‍ර, සවන්, පක්ෂ (4) සිරිත, සඳුන්, සතර, පුත්

15. අරුණෝදය, ගිරග, වත්තල, සුරනිඳු යන පදවල නිවැරදි ව විසන්ධි කොට ඇති වරණය තෝරන්න.

(1) අරුණ + උදය, ගිරි + අග, වත් + හල, සුරන් + ඉඳු

(2) අරුණ + ඔදය, ගිර + අග, වත් + අල, සුරන් + ඉඳු

(3) අරුණ + උදය, ගිරි + අග, වත් + සල, සුර + ඉඳු

(4) අරුණ් + ඔදය, ගිර + අග, වත් + හල, සුරනි + ඉඳු

16. වර්ගාන්ත අක්ෂර පමණක් ඇති වරණය තෝරන්න.

(1) ඟ, ඡ, ඞ, ඳ, ඹ (2) ය, ර, ල, ව (3) ඞ, ඤ, ණ, න, ම (4) ක, ච, ට, ත, ප

17. උපමාවක් සහිත කවි පදය තෝරන්න.

(1) වහිනවා වහිනවා වහිනවා වහිනවා (2) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා

(3) කළුවලා කැලඹෙමින් මුදුන් වී නැගෙනවා (4) අකුණු ගෙඩි ගිගුම් දී විදුලි ඉරි දුවනවා

◆ අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

18. (1) අපි සියල්ලන් ම ශ්‍රී ලාංකිකයෝ වෙමු. (2) අප සියල්ලෝ ම ශ්‍රී ලාංකිකයන් වෙමු.

(3) අප සියල්ලන් ම ශ්‍රී ලාංකිකයන් වෙමු. (4) අපි සියල්ලෝ ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.

19. (1) මම මිතුරියක් හමුවීමට ගියෙමි. (2) අපි සමඟිදම රැකිය යුතු ය.

(3) දක්ෂ ක්‍රීඩිකාවක් වන්නේ කෙසේ ද? (4) ඔතොමෝ ගමට යන්නීය.

20. (1) ළමා පෙළ ක්‍රීඩා පිටියට යයි. (2) කපුටු රංචුව නොකඩවා නාද කරති.

(3) තරු පෙළ අහසේ බැබළෙති. (4) හංස පන්තිය නීල ජලයේ පීනයි.

*****